Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා විදේශ රැකියා නිමකර පැමිණෙන්නන්ගෙන් වන දායකත්වය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරිනි

*එච්.එම්.ඩී.ඩී. ගුණතිලක*[1]
*සීතා පී.බී.රණතුංග*[2]

සංක්ෂේපය

විදේශ සේවා නියුක්තිකයින් ලබන ප්‍රේෂණ රටක අභ්‍යන්තර මූල්‍ය සංවර්ධනයේ ප්‍රධාන ම මූලාශ්‍රයකි. 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නිදහසේ ගලා යන සංක්‍රමණ ප්‍රතිපත්තිය යටතේ මෙරට ශ්‍රම සංක්‍රමණය ආරම්භ වූ අතර මෙරට විදේශ විනිමය ඉපයීමේ ප්‍රධානත ම මූලාශ්‍රය බවට පත් වී ඇත. මෑත කාලීනව ග්‍රාමීය ජනතාව විදේශ රැකියා කරා වැඩි වශයෙන් යොමු වීමේ ප්‍රවණතාවයක් පවතියි.  මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරන්නේ විදේශ රැකියා නිම කර පැමිණෙන්නන් ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා කවරාකාර දායකත්වයක් දක්වා තිබේ ද යන්න අධ්‍යයනය කිරීම යි.

ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගනු ලැබීය. අධ්‍යයන නියැදිය තෝරා ගැනීමේ දී විදේශ රැකියාව අවසන් කොට නැවත ශ්‍රී ලංකාවට පැමිණ වසරක් ඉක්මවූ සහ නැවත විදේශ රැකියා කරා යොමු වීමට අපේක්ෂා නොකරන පුද්ගලයින් 50 ක නියැදියක් සසම්භාවීව තෝරා ගන්නා ලදි. අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම් වේ. ප්‍රශ්නාවලියක් භාවිත කරමින් රැස් කරන ලද ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමය සහ කයි වර්ග පරීක්ෂා ඔස්සේ විග්‍රහ කරන ලදි.

අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව සංක්‍රමණය මගින් ග්‍රාමීය අංශයේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑම් ඇති කරයි. සංක්‍රමණයෙන් පසු කුටුම්බ ආදායම 72.86% කින් වර්ධනය වී තිබේ. සියලු ම සංක්‍රමණිකයින්ගේ නිවාසවල තත්ත්වය විදේශ සංක්‍රමණයෙන් පසු වර්ධනය වී තිබෙන අතර සංක්‍රමණය පෙර නිවාස නොතිබුණු කුටුම්බවලින් 83.3% ක් නව නිවාස ඉදි කරගෙන තිබේ. කුටුම්බවල අධ්‍යාපනය වියදම් 84.4% කින් වර්ධනය වී තිබෙන අතර ම කුටුම්බ සතු ඉඩම් ප්‍රමාණය 5.65% කින් වර්ධනය වී තිබේ. සංක්‍රමණයෙන් පසුව කුටුම්බ 40% ක් පෙර භාවිත නොකළ සී.ඩී.ප්ලේයර්, හෝම් තියටර් සිස්ටම්ස්, අවන් වැනි උපකරණ මිල දී ගෙන තිබෙන බව ද අධ්‍යයනය මගින් අනාවරණය විය. නමුත් විදේශ රැකියාවේ නියුතු වීමට පෙර කුටුම්බ ආදායම කෙරෙහි 49.8% ක දායකත්වයක් ඔවුන්ගෙන් ලැබුණ අතර නැවත මෙරටට පැමිණි පසු එය 40.6% දක්වා පහළ බැස තිබේ. විදේශ රැකියාවෙන් පසු සංක්‍රමණය වූ පුද්ගලයන්ගේ විරැකියා ප්‍රතිශතය 30% දක්වා වර්ධනය වී තිබෙන අතර සේවා නියුක්ත වූවන්ගෙන් 51% ක් යොමු වී තිබෙන්නේ කෘෂිකාර්මික අංශය කෙරෙහි ය.

ප්‍රමුඛ පදඃ ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය, ප්‍රේෂණ, විදේශ රැකියා නිම කර පැමිණි අය, ග්‍රාමීය ආර්ථික සංවර්ධනය, ශ්‍රී ලංකාව

1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilanidg@gmail.com
2. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, seethe@kln.ac.lk